# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2093/7 - 2018 ඔක්තෝබර් මස 16 වැනි අඟහරුවාදා - 2018.10.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වන සංරක්ෂණ ආඥාපනත

1966 අංක 13, 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත් වලින් සංශෝධිත (451 වැනි අධිකාරය) වූ වන සංරක්ෂණ ආඥාපනතේ 3 ''අ'' වගන්තිය යටතේ වූ නියමය.

නියමය

1966 අංක 13, 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත් වලින් සංශෝධිත (451 වන අධිකාරය) වූ වන සංරක්ෂණ ආඥාපනතේ 3 ''අ'' වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය, මෛත්‍රීපාල සිරිසේන වන මම, පහත අංක 01 හා 02 දරන උපලේඛනවල සහ එහි මායිම් තුළ පිහිටි හෙක්ටයාර් 6.9048 ක් වූ විශාලත්වයෙන් යුතු බෝගල්කන්ද වනාන්තරය වර්ෂ 2018 ක් වූ සැප්තැම්බර් මස 21 වැනි දින සිට බෝගල්කන්ද සංරක්ෂණ වනාන්තරය ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,<br>
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 21 වැනි දින,<br>
බත්තරමුල්ල,<br>
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය 01

(පහළ බෝගල්කන්ද)

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹගමුව කෝරළේ මැඩිල්ල ගමෙහි FVP 105 පිඹුරේ බිම් කට්ටි අංක 57 ලෙස හඳුන්වන බෝගල්කන්ද වනාන්තරයට අයත් මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 3.1898 විශාලත්වයෙන් යුතු රජය සතු ඉඩම් ප්‍රදේශය වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | FVP 104 ගෝනාවල, FVP 105 මැඩිල්ල බිම් කට්ටි අංක 21, 56, 22 1/2, 24, 56, 33 (තිනියගල කඳුර) ; |
| *නැගෙනහිරට* | : | FVP 104 ගෝනාවල, බිම් කට්ටි අංක 25, 54, 53, 51, 50, 49, 48, 47, 46, 47, 48, 49, 50, 52, 53, 54, 55, 27, 29, 58, බිම් කට්ටි අංක 33 (තිනියගල කඳුර) FVP 108 තිනියගල ; |
| *දකුණට* | : | බිම් කට්ටි අංක 32, බිම් කට්ටි අංක 33 (තිනියගල කඳුර) FVP 105 මැඩිල්ල, FVP 108 තිනියගල ; |
| *බටහිරට* | : | බිම් කට්ටි අංක 33 (තිනියගල කඳුර) බිම් කට්ටි අංක 32, 31, 32 FVP 105 මැඩිල්ල, FVP 108 තිනියගල. |
| *ප්‍රමාණය* | : | හෙක්. 3.1898 |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය 02 (ඉහළ බෝගල්කන්ද)**

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹගමුව කෝරළේ ගෝනාවල ගමෙහි FVP 104 පිඹුරේ බිම් කට්ටි අංක 178 ලෙස හඳුන්වන බෝගල්කන්ද වනාන්තරයට අයත් මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 3.7150 විශාලත්වයෙන් යුතු රජය සතු ඉඩම් ප්‍රදේශය වේ.

*උතුරට* : බිම් කට්ටි අංක 35, 34 රදාඹය, 179 FVP 104 ගෝනාවල ;

*නැගෙනහිරට* : බිම් කට්ටි අංක 34 රදාඹය බිම් කට්ටි අංක 179, 40, 182, 44, 46 FVP 104 ගෝනාවල ;

*දකුණට* : බිම් කට්ටි අංක 46, 45, 46, 181, 37, 38, 36 FVP 104 ගෝනාවල, FVP 105 මැඩිල්ල ;

*බටහිරට* : බිම් කට්ටි අංක 181, 180, 38, 177, 35 FVP 104 ගෝනාවල, බිම් කට්ටි අංක 34 රදාඹය FVP 105 මැඩිල්ල.

*ප්‍රමාණය* : හෙක්. 3.7150

11 - 48

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.